**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව - 2021**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාවේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාවේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රක්ෂණයේ හර මූලධර්ම (ICPs) යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) මගින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. රක්ෂණ නියාමකයින්ගේ නියාමන සහ අධීක්ෂණ කාර්යයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීමේ දී සහ රට තුළ රක්ෂණ ක්ෂේත්‍රය සඳහා රෙගුලාසි හඳුන්වාදීමේ රාමුවක් ලෙස භාවිතා කිරීමේ දී එම මූලධර්ම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමයේ (IAIS) සාමාජිකයෙකු වශයෙන් මෙම කොමිෂන් සභාව මගින් 2020 වර්ෂය සඳහා සාමාජික ගාස්තුව ලෙස රු.4,124,500 ක් ගෙවා තිබුණි. කොමිෂන් සභාව විසින් රක්ෂණයේ හර මූලධර්මවලට අනුකූලව කටයුතු කරන ආකාරය හඳුනා ගැනීම සඳහා තොරතුරු ඉල්ලා තිබුණි. කෙසේ වුවද, ඉල්ලා සිටි තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණයේ හර මූලධර්ම සඳහා සිදු කරන ලද සමියුරු සමාලෝචන කිහිපයෙන් කොටසක් සිදු කර ඇත. තක්සේරුව සම්පූර්ණයෙන්ම පාහේ නිරීක්ෂණය කරනු ලබන 1,2, 9, 10 යන රක්ෂණයේ හර මූලධර්ම සඳහා සමියුරු සමාලෝචන සිදු කර ඇති අතර 2019 වර්ෂයේදී ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකවරුන්ගේ සංගමය (IAIS) මගින් මේ වන විට රක්ෂණයේ හර මූලධර්ම 25ක් අනුමත කර ඇත. රක්ෂණ කර්මාන්ත නියාමන පනතට සහ අනුනීතිකරණය සඳහා සුදුසු විධිවිධාන සැකසීම / ඒ සඳහා සංශෝධන සිදු කිරීමේදී රක්ෂණයේ හර මූලධර්ම පිළිබඳ වැඩිදුර සමාලෝචන සිදු කෙරේ. | කළමනාකාරිත්වය විසින් විගණනය මගින් ඉල්ලා සිටින තොරතුරු නියමිත වේලාවට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය දක්වා ඒ ඒ වර්ෂය සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වල අතිරික්තය රක්ෂණ ඔප්පුහිමියන් සුරැකීමේ අරමුදලට මාරු කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී මෙම ප්‍රතිපත්තිය හදිසියේ වෙනස් කර තිබුණු අතර කොමිස් අරමුදල්වල අතිරික්තය සමුච්චිත අරමුදල් ලෙස ඉදිරියට ගෙන ගොස් තිබුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනුමැතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මෙම අරමුදල නිසි ලෙස නිරීක්ෂණය නොකළහොත්, මෙම අරමුදල අවභාවිත කිරීමට ඉඩ ඇත. | කළමනාකාරිත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | වාර්තාකරණ රාමුවේ විධිවිධාන අනුව සහ සුදුසු අධිකාරියක් සහිතව ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කළ යුතු වන්නේය. |

## 1.6 සම්බන්ධිත පාර්ශ්ව සහ සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 02 දෙනා සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබුණි. මෙම ආවරණය සඳහා 2021 වර්ෂය සඳහා රු. 111,830 ක රක්ෂණ වාරිකයක් ගෙවා තිබුණි. | 2021 වසරේ ඇති වූ වසංගත තත්ත්වය හේතුවෙන්, වසංගත තත්ත්වය යටතේ කොමිෂන් සභා රැස්වීම්වලට සහභාගී වීමේදී අවදානමට නිරාවරණය වූ බැවින්, විශේෂයෙන්ම COVID-19 අවදානම අවම කිරීම සඳහා, මෙම තත්ත්වය හේතුවෙන් ඇති වී ඇති අවශ්‍යතා යටතේ, කොමිෂන් සභාවේ ඇතැම් සාමාජිකයන් විසින් ඔවුන් සඳහා ලබා දී ඇති රක්ෂණ ආවරණය දීර්ඝ කරන ලෙස ඉල්ලීම් කළහ. ආවරණය සක්‍රිය කිරීමට ඇති වූ ඉහළ ප්‍රමුඛතාවය හේතුවෙන්, කොමිෂන් සභාවේ අනුමැතිය මත එය ලබා දී ඇති අතර සාමාජිකයින්ට රක්ෂණ ආවරණයක් ලබාදීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගින් කටයුතු සිදු කර නොමැති බවට විගණන කමිටු සභාපතිවරයා විසින් අදහස් දක්වයි. සභාපතිවරයා සහ නිලබලයෙන් සාමාජිකත්වය දරන සාමාජිකයන් තිදෙනා එම පහසුකම ලබා ගෙන නොමැත . | ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අදාළ චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු අතර කිසියම් අපගමනයක් සිදු කිරීමට අවශ්‍ය වේ නම් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 10 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ අංක PS/GPA/ චක්‍රලේඛය/ 36/2020, 2019 දෙසැම්බර් 04 දිනැති අයවැය චක්‍රලේඛ අංක 07/2019 සහ 2019 ජුනි 17 දිනැති | එකී 4/2019 චක්‍රලේඛයේ 2 (V) වගන්තිය අනුව, නිලධාරියකුගේ සහභාගීවීම / රාජකාරී සුවිශේෂී සහභාගීවීමක් අත්‍යවශ්‍ය නොවන්නේ නම්, දේශීය අරමුදලින් වියදම් දරමින් නිලධාරීන් සම්මන්ත්‍රණ / වැඩමුළු ආදියට සහභාගී නොවිය යුතුය. එයට අමතරව, අනවශ්‍ය වියදම් සිදු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් චක්‍රලේඛවලින් උපදෙස් ලබා දී ඇත. කොමිෂන් සභාව මගින් 2021 මාර්තු 29 වන දින හෝටලයක දී කොමිෂන් සභා අරමුදල් | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සංවත්සර සැමරුම එහි 20 වසරක ඉතිහාසයේ පළමු වතාවට පවත්වන ලදී. එමගින් කොමිෂන් සභාවේ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට කොමිෂන් සභාව වෙත ඔවුන්ගේ උපරිම දායකත්වය ලබා දීමට අභිප්‍රේරණයක් ලබා දෙන ලදී. පළමු වතාවට පවත්වනු ලබන කොමිෂන් සභාවේ එවැනි උත්සව අවස්ථාවකට සමස්ත කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය අත්‍යවශ්‍ය වන බැවින්, මෙම උත්සව අවස්ථාවට සහභාගි වන ලෙස සමස්ත කාර්ය මණ්ඩලයටම ආරාධනා කර තිබුණි. ලිපියේ සඳහන්ව පැවති පරිදි, මෙය සම්මන්ත්‍රණයක් / වැඩමුළුවක් හෝ නොවීය.<br>සේවය සඳහා සම්මානයක් පිරිනැමීම යනු යම් කාල පරිච්ඡේදයක් තුළ මෙම ව්‍යාපාරය වෙනුවෙන් සිදු කරන ලද සේවය සඳහා ස්තූතිය පිරිනැමීමක් වශයෙන් සේවකයකු වෙත සම්මානයක් පිරිනමනු ලබන අවස්ථාවයි. සම්මානයක් පිරිනැමීම මගින්, එම සේවකයන් | කළමනාකාරීත්වය විසින් අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද අදාළ වන චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| අයවැය චක්‍රලේඛ අංක 4/2019. | රු.411,454 මගින් එහි 20 වන සංවත්සරය පවත්වා තිබුණි.<br><br>තවද, මෙම 20 වන සංවත්සර සැමරුම් උළෙලේ දී කොමිෂන් සභා අරමුදල්වලින් රු. 952,600 ක මුදලක් වැය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයන් 16 දෙනෙකු සඳහා රන් කාසි පිරිනමා තිබුණි. | කොමිෂන් සභාවට වටිනාකමක් සහිත සේවකයන් වන බව එම සේවකයන්ට පෙන්වා දෙන අතර ඔවුන් එම ආයතනය වෙනුවෙන් දක්වන ලද කැපකිරීම පිළිගැනීමකට ලක් නොවී නොපවතින බවත් ඔවුන්ගේ සේවය ඇගයීමට ලක් වන බවත් පෙන්වා දෙයි. මෙහි අරමුණ වන්නේ සේවකයින් දීර්ඝ කාලයක් මෙම ආයතනයේ සේවයේ නියුක්ත වීම සඳහා දිරිගැන්වීමයි. නව සේවකයන් බඳවා ගැනීම සඳහා ගත වන කාලය, ඒ සඳහා දැරිය යුතු වෙහෙස සහ බඳවා ගැනීමේ හා පුහුණු කිරීමේ පිරිවැය සැලකිය යුතු අන්දමින් ඉහළ මට්ටමක පවතින බව හා කාර්ය මණ්ඩල පිරිවැටුම ආයතනයේ ප්‍රතිඵල කෙරෙහි නිශේධනාත්මක බලපෑමක් සිදු කළ හැකි බව පිළිගත් කරුණකි<br>ප්‍රසම්පාදන කාර්යපටිපාටිය අනුගමනය කිරීමෙන් පසුව, ස්ථානය තෝරා ගත් අතර රජයට අයත් හෝටලයක් වන හිල්ටන් හෝටලය රු. 280,000/- ක් වැනි සාධාරණ පිරිවැයකට තෝරා ගන්නා ලදී. | |
| (ආ) 2003 ජුනි 02 දිනැති චක්‍රලේඛ අංක පීඊඩී/12 මගින් හඳුන්වා දෙන ලද යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ. | මාර්ගෝපදේශයේ 9.14.2 ඡේදයට අනුව, පිළියෙළ කරන ලද කාර්ය පටිපාටි සංග්‍රහ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කළ යුතු අතර ඉන් අනතුරුව, මහා භාණ්ඩාගාරයට අයත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හරහා මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ එකඟතාව ලබා ගත යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාව මගින් සකස් කරන ලද පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. එබැවින්, ආයතන සංග්‍රහයේ විධිවිධාන මේ සම්බන්ධයෙන් අදාළ කර ගත යුතුය. එහෙත්, | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් සකස් කරන ලද පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය (සංග්‍රහය) බොහෝ කාලයකට පෙර සකස් කර තිබුණි. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපතිධුරය යටතේම මෙහෙයවනු ලැබූ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (එකල ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය), පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය මත ප්‍රධාන වශයෙන්ම පදනම් වී තිබුණි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව එහි රක්ෂණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ආරම්භයේ සිටම එම පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය අනුගමනය කර තිබුණි. අවශ්‍යතාව මත පදනම්ව, රක්ෂණ මණ්ඩලයේ / කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව, එම පරිපාලන කාර්ය පරිපාටි සංග්‍රහයට කාලීනව වෙනස්කම් ඇතුළත් කර තිබුණි. යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ මත පදනම් වෙමින්, එම පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර | කොමිෂන් සභාව මගින් සකස් කරන ලද පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා අදාළ බලධාරීන්ගෙන් අනුමතිය ලබා ගත යුතු වන්නේය. එවැනි අනුමැතියක් ලබා ගන්නා තුරු, අදාළ මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කොමිෂන් සභාව විසින් සේවකයන් පස් දෙනෙකු සඳහා 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/99 ට අනුව ආපදා ණය සඳහා අනුමත උපරිම සීමාව වූ රු. 250,000 ඉක්මවා, අනුමත නොකරන ලද පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය මත පදනම්ව රු. 325,000 ක අවම ආපදා ණය මුදලක් සහ රු. 500,000 ක උපරිම ආපදා ණය මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ වැඩිපුර ලබා දී තිබුණු ආපදා ණය මුදල රු.662,000 ක් විය. | තිබුණි. මුල් පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය 2012 ඔක්තෝබර් 23 දින අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණු අතර මේ සම්බන්ධයෙන් සිහි කැඳවීම් කලින් කලට යවන ලදී. ඉන් අනතුරුව, මෙම පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා සිදු කරන ලද වෙනස්වීම් පිළිබඳව ද දන්වා සිටින ලදී.<br>අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටියේ සංකීර්ණතා හේතුවෙන් පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාපටිපාටියේ ප්‍රමාදයක් පැවති බව 2018 අප්‍රේල් 05 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් දැනුම් දෙන ලදී. තවද, පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳට ඔවුන් විසින් සලකා බලන තෙක්, පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහයේ ඇතුළත් කර ඇති ක්ෂේත්‍රවලට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ අප විසින් අනුගමනය කිරීම අවශ්‍ය බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සඳහන් කරන ලදී. |
| (ඇ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වන වගන්තිය | කාරයක් මල දී ගැනීමට බැංකු මගින් ණය ලබා දීම සඳහා විධිවිධාන සලසා තිබුණ ද, වර්ෂය තුළ සේවකයන් තිදෙනෙකු සඳහා කොමිෂන් සභා අරමුදල්වලින් රු.1,200,000 ක වාහන ණය ලබා දී තිබුණි. | ඒ අනුව, කොමිෂන් සභාව විසින් IRCSL හි කාර්ය මණ්ඩලයට සපයා ඇති පහසුකම් සහ රජයේ නියෝග / චක්‍රලේඛ මගින් සපයා ඇති පහසුකම් අතර සැසඳීමක් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පහසුකම්වල සැලකිය යුතු වෙනස්කම් පවතින බව දක්නට ලැබුණි.<br>රජයේ චක්‍රලේඛ අනුගමනය කිරීමට අපට නොහැකි වීම පිළිබඳව විස්තර කිරීම විචක්ෂණශීලී කාර්යයක් වන බව කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. තීරණාත්මක වෙනස්කම් සිදු කිරීම මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විධිමත්ව මෙහෙයවීමට ප්‍රබල බාධාවක් සිදු වනු ඇති බවද, කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහයට අනුව ඉදිරි කටයුතු සිදු කළ යුතු බවද පැහැදිලි කරන ලදී.<br>නීතිපතිවරයා විසින් තහවුරු කර ඇති පරිදි, කාර්ය මණ්ඩලයේ පාරිශ්‍රමික සහ සේවයේ නියුක්ත කිරීමේ තත්ත්ව පිළිබඳ නිර්ණය කිරීමේ පූර්ණ අධිකාරි බලය පනත මගින් කොමිෂන් සභාව වෙත පවරා ඇති බව ද සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් එහි කාර්ය මණ්ඩලය වෙත ලබා දී ඇති පහසුකම්වලට වඩා ඉහළ |

පහසුකම් එයට සමාන මූල්‍ය අංශවල නියාමකවරු ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලට ලබා දී තිබේ.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 86,790,315 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ එයට අනුරූප අතිරික්තය රු. 109,272,297 ක් විය. එම නිසා, මූල්‍ය ප්‍රතිඵලයේ රු. 22,481,982 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මූල්‍ය අංශ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය මගින් ලද ආදායම රු. 12,089,251 කින් අඩුවීම හා ප්‍රදාන රු. 2,905,041කින් අඩුවීම සහ කාර්ය මණ්ඩල පිරිවැය රු. 16,374,005 කින් වැඩි වීම සහ මෙහෙයුම් පිරිවැය රු. 4,751,825 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විස්තරය | මුදල (රු.) | | | වෙනසේ ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|
| | 2021 | 2020 | 2019 | 2021 | 2020 | 2019 |
| **ආදායම** | | | | | | |
| ප්‍රදාන හඳුනා ගැනීම | - | 2,905,041 | 2,324,391 | -100% | 25% | 20% |
| මූල්‍ය අංශ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය මගින් ලැබුණු ආදායම | 255,150 | 12,344,401 | 81,620,094 | -98% | -85% | - |
| ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුමේ සහ ඇමතුම් ගිණුමේ පොළිය | 6,893,783 | 479,514 | 3,698,834 | 1,338% | -87% | 9,976% |
| භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනය මත පොළිය | - | 33,151,511 | 92,882,074 | - | -64% | -2% |
| ස්ථාවර තැන්පතු මත පොළිය | 515,764,257 | 588,341,378 | 477,484,713 | -12% | 23% | 33% |
| **වියදම්** | | | | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 127,134,065 | 109,096,963 | 112,323,915 | 17% | -3% | 42% |
| කොමිෂන් සභා සාමාජිකයෝ - රැස්වීම් සඳහා සහභාගී වීමේ දීමනා | 1,384,859 | 865,972 | 540,000 | 60% | 60% | 2% |
| කාර්ය මණ්ඩල සුබසාධනය | 4,459,324 | 2,038,778 | 841,693 | 119% | 142% | -28% |
| කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණය | 2,328,894 | 2,001,327 | 1,615,932 | 16% | 24% | 45% |
| කාර්ය මණ්ඩල පුහුණුව දේශීය සහ යැපුම් දීමනා | 921,188 | 401,492 | 1,610,639 | 129% | -75% | 27% |
| ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම | 1,796,425 | 1,673,310 | 1,218,344 | 7% | 37% | 77% |
| මුද්‍රණය සහ ලිපිද්‍රව්‍ය | 2,764,004 | 2,413,783 | 3,406,080 | 15% | -29% | 106% |
| මහජනතාව දැනුවත් කිරීම | 1,814,843 | 1,459,568 | 9,834,508 | 24% | -85% | 309% |
| කාර්යාල උපකරණ නඩත්තුව ඉලෙක්ට්‍රොනික දත්ත සැකසීම සහ වෙනත් | 2,103,839 | 3,298,073 | 2,107,863 | -36% | 56% | 21% |
| අධ්‍යක්ෂවරුන්ගේ වාහන | 4,570,890 | 3,166,986 | 3,246,712 | 44% | -2% | 4% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දීමනාව | | | | | | |
| අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනාව | 1,356,590 | 1,030,514 | 1,066,755 | 32% | -3% | 6% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

අවසාන වර්ෂ පහ සඳහා කොමිෂන් සභාව සහ කර්මාන්තය සඳහා ගණනය කරන ලද ප්‍රධාන අනුපාත පහත දක්වා ඇති පරදි වේ.

| කොමිෂන් සභාව | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වර්ධනය | 12% | 19% | 24% | 23% | 25% |
| වාර්ෂික සෙස් ආදායමේ වර්ධනය | 7% | 3% | 3% | 15% | 2% |
| සෙස් ආදායම දළ ලිඛිත වාරිකයේ ප්‍රතිශතයක් ලෙස | 0.23% | 0.24% | 0.25% | 0.26% | 0.29% |
| වාර්ෂික ගාස්තු ආදායමේ වර්ධනය | 5% | 3% | 33% | 19% | 13% |
| වාර්ෂික ගාස්තු ආදායම දළ ලිඛිත රක්ෂණ වාරිකයේ ප්‍රතිශතයක් ලෙස | 0.11% | 0.12% | 0.11% | 0.09% | 0.09% |
| **කර්මාන්තය** | | | | | |
| දළ ලිඛිත වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 1.38% | 1.39% | 1.27% | 1.24% | 1.19% |
| රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම් රු. බිලියන | 879.8 | 789.7 | 689.6 | 606.6 | 564.9 |
| රක්ෂණ ක්ෂේත්‍රයේ මුළු වත්කම්වල වර්ධනය | 11% | 15% | 14% | 7% | 8% |
| රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් මූල්‍ය අංශයේ මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 3.29% | 3.37% | 3.44% | 3.32% | 3.31% |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ කාර්යාලීය කටයුතු බාහිර ගොඩනැගිල්ලක දී සිදු කරන ලද අතර වඩාත් අරපිරිමැසුම්දායි ස්ථානයක් සොයා ගැනිමෙන් තොරව, 2021 වර්ෂයේ දී මෙම ගොඩනැගිල්ලේ බදු කුලිය වශයෙන් රු. 48,109,101 ක මුදලක් ගෙවා තිබුණි. | 2024 සැප්තැම්බර් මාසයේ වර්තමාන බදු කාලසීමාව අවසන් වන තෙක් ඕවර්සීස් රියැල්ටි (ලංකා) පීඑල්සී හි පිරිනැමීම භාර ගැනීමට කොමිෂන් සභාව විසින් එහි 224 වන රැස්වීමේ දී තීරණය කරන ලදී. වසර දෙක ඉකුත් වන අවස්ථාවේ දී, කොමිෂන් සභාව සඳහාම පරිශ්‍රයක් මිලදී ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බලන ලෙස කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටින ලදී. | කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ කටයුතු සිදු කිරීම සඳහා සුදුසු වන වඩාත් අරපිරිමැසුම්දායක ස්ථානයක් සොයා ගත යුතුය. |
| (ආ) රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ දක්වා ඇති කාර්යභාරය ඉටු කිරීම සඳහා මහජනතාව සමඟ සමීපව කටයුතු කිරීම අවශ්‍ය වන අස්තිත්වයක් වශයෙන් සැලකේ. කෙසේ වුවද, වර්තමානයේ | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ අන්තර්ගතය ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට සහ දමිළ භාෂාවට පරිවර්තනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීහූ මහජනතාව සමඟ ලිපි මගින් සහ දුරකථනය මගින් | කොමිෂන් සභාව විසින් අවශ්‍ය පහසුකම් ලබා දීම මගින් මහජනතාව සඳහා වඩාත් කාර්යක්ෂම සේවයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| එය පිහිටි ස්ථානය, එහි සංස්කෘතිය, සහ එහි පිවිසුම් ස්ථාන දැඩි ආරක්ෂක තත්ත්ව යටතේ පවත්වාගෙන යන අතර එබැවින් පීඩාවට පත් විය හැකි සාමාන්‍ය ජනතාවට එයට ප්‍රවේශ වීම අසීරු වී තිබේ. තවද, කොමිෂන් සභා පරිශ්‍රයට ඇතුළු වීමට මහජනතාවට සහාය වීම සඳහා මෙම කොමිෂන් සභාවේ ඉදිරිපස කාර්යාලයේ නිලධාරියෙකු සේවයේ යොදවා නොමැති බොහෝ අවස්ථා නිරීක්ෂණය කළ හැකි විය. තවද, වෙබ් අඩවියේ සියලුම තොරතුරු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් දැක්වෙන බව නිරීක්ෂණය විය. | සන්නිවේදන කටයුතු සිදු කිරීමේ දී සහ කාර්යාලීය කටයුතු සඳහා මහජනතාව කාර්යාලයට පැමිණෙන අවස්ථාවලදී මහජනතාවට පහසු භාෂාවකින් (සිංහල, දමිළ හෝ ඉංග්‍රීසි) මහජනතාව වෙත සේවා ලබා දෙති. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පීඩාවට පත් කණ්ඩායම්වලට මෙම කොමිෂන් සභාව වෙත පැමිණ සේවා ලබා ගැනීමේ පහසුකම් ද ඇතුළත්ව මහජනතාව වෙත සියලුම පහසුකම් ලබා දී තිබේ. | |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු නොකර 2019 වර්ෂයේ දී කොමිෂන් සභාව මගින් මෘදුකාංග සඳහා රු. 1,013,000 ක් ද, වාර්ෂික දායක මුදල් වශයෙන් රු. 923,000 ක් ද වැය කරමින් මණ්ඩල රැස්වීම් සඳහා විසඳුමක් මිලදී ගෙන තිබුණි. විගණනය විසින් සිදු කරන ලද පිරිවැය විශ්ලේෂණයට අනුව, 2020 සහ 2021 වර්ෂවලදී පවත්වන ලද මණ්ඩල රැස්වීම් 01 ක් සඳහා මෘදුකාංග සඳහා පිරිවැය රු. 63,533 ක් වී තිබුණි. එබැවින්, මෙය කොමිෂන් සභාව සඳහා පිරිවැය ඵලදායක රැස්වීම් විසඳුමක් ද යන්න ගැටළු සහගතය. | මෙම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම පහත දක්වා ඇති ප්‍රතිලාභ ලබා ගැනිම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත.<br>• ක්ෂණික ප්‍රවේශය.<br>• ලේඛන සඳහා ප්‍රවේශ වීමට සහාය ලබා දීම සහ ලේඛන බෙදා ගැනීමට සහාය ලබා දීම.<br>• දුරස්ථ ප්‍රවේශය.<br>• අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ බැඳීම වැඩි කිරීම.<br>• ඉකුත් රැස්වීම් වාර්තා සඳහා ක්ෂණික ප්‍රවේශය ආදිය.<br>කෙසේ වුවද, රැස්වීමක් සඳහා මෘදුකාංග පිරිවැය ගණනය කිරීම සඳහා සලකා බලන ලද පිරිවැය වූ රු. 2,859,000, රු. 38,120 වශයෙන් ප්‍රතිශෝධනය කළ යුතු වීම සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවීමට අපි අපේක්ෂා කරමු. රැස්වීම් න්‍යාය පත්‍රය මුද්‍රණය සඳහා අවශ්‍ය වන අතිවිශාල කඩදාසි සංඛ්‍යාව සහ ටෝනර් සඳහා වැය වන පිරිවැය අඩු කර ගැනීමට ද, ලේඛනවල ඡායා පිටපත් ගැනීමට ගත වන කාලය සහ න්‍යාය පත්‍ර භාර දිමට ගත වන කාලය අඩු කර ගැනීම ආදිය සඳහා මෙම මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට | කොමිෂන් සභාව සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් හඳුන්වා දීමට පෙර නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කිරිම අවශ්‍ය වන අතර ඒ සම්බන්ධයෙන් නිසි බලධාරීන්ගෙන් උපදෙස් ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| | හැකියාව ලැබුණි. තවද, මෙම පද්ධතිය මගින් මණ්ඩල පත්‍රිකා සහ මණ්ඩල තීරණ ස්වයංක්‍රීයව අධිලේඛනගත කිරීම සිදු කෙරේ. ඉහත දක්වා ඇති හේතු මත, වෙනත් රජයේ ආයතන මගින් මේ ආකාරයේ විසඳුම් භාවිත කරයි. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පිරිවැය සමඟ සංසන්දනය කිරීමේ දී, මෙම විසඳුමෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගන්නා ලදී. | |
| (ආ) මෙම මණ්ඩල රැස්වීම් විසඳුම මගින් මණ්ඩල පත්‍රිකා සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා එක් මණ්ඩල රැස්වීමක් සඳහා සාමාන්‍ය පිරිවැය රු. 92,995 ක් වී තිබුණි. එබැවින් මෙම විසඳුම පිරිවැය ඵලදායි විසඳුමක් දැයි සැක සහිතය. | කළමනාකාරීත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ සේවකයන් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, කොමිෂන් සභාව මගින් 2021 වසර සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගැනීම සඳහා සේවකයින්ගෙන් කිසිදු දායක මුදලක් ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභාවේ අරමුදල්වලින් රු.මිලියන 6.2 ක් වැය කර තිබුණි. කෙසේ වුවද, 2017 වර්ෂයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අර්ධ රාජ්‍ය අංශයේ සේවකයින් සඳහා ද එක් සේවකයෙකු සඳහා මසකට රු.1000 ක දායක මුදලක් අය කරමින් අග්‍රහාර රක්‍ෂණ යෝජනා ක්‍රමය පුළුල් කර තිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ආරම්භයේ සිටම කොමිෂන් සභාවේ සේවකයින් සඳහා රක්ෂණ ආවරණ ලබා දී ඇත. මෙය සේවකයන්ගේ පාරිශ්‍රමික පැකේජයේ කොටසකි. සෑම අවස්ථාවකදීම ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය කර ඇත.<br>පීඊඩී 6/2019 චක්‍රලේඛය මගින් උපදෙස් දී ඇති වෙනත් කරුණු අතර, අදාළ වන පිරිවැය, ආවරණය කළ යුතු අවදානමේ ස්වභාවය සහ සේවාවේ ගුණාත්මකභාවය මෙන්ම ආයතනය වෙත මෙම සේවාවන් ලබා ගැනීමේ පහසුව පිළිබඳව ද සලකා බැලීමට ආයතනවලට උපදෙස් ලබා දී ඇත.<br>2019 සැප්තැම්බර් 12 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 06/2019 (i) (පිටු අංකය 51) මගින් නියම කර ඇති අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් වෙළඳපොළ කොටස මත පදනම්ව ඉහළම රක්ෂණ සමාගම් 5 වෙතින් සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රජයට අයත් රක්ෂණ සමාගම්වලින් ද මිල ගණන් කැඳවීමට තීරණය කරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල මිල ගණන් අමුණා නොතිබුණි.<br>දීර්ඝ කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන | සේවකයින් සඳහා ස්වයං දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දිය යුතු බව නිර්දේශ කෙරේ. |

| | | |
|---|---|---|
| | කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය රක්‍ෂණ සැපයුම්කරු වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එම ස්ථානයේදීම හිමිකම් පියවීමේ සේවාව සහ COVID 19 සඳහා විස්තීර්ණ ආවරණයක් ලබා දීම ඇතුළුව ගුණාත්මක සේවාවක් සපයයි.<br>තවද, පූර්වයෙන් ලබා ගත් අත්දැකීම්වලට අනුව, මෝටර් රථ සහ පුද්ගලික අනතුරු ආවරණය වැනි හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල සතුටුදායක සේවාවක් සපයා නොමැත.<br>තවද, අග්‍රහාර රක්ෂණ ක්‍රමයට භාණ්ඩාගාරයෙන් සහනාධාර ලබා දේ. එබැවින් එය සුදුසු නොවනු ඇත. | |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන උපදේශකවරයෙකු තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී යෝජනා සමඟ අභ්‍යන්තර විගණන වැඩ සැලැස්මක් ලබා ගෙන නොතිබුණි. අනතුරුව, උපදේශකවරුන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම සඳහා ඇගයීම් අදියරේදී වැඩ සැලැස්මක් නැවත කැඳවා තිබුණි. | සියලුම යෝජකයින් විසින් ඔවුන්ගේ යෝජනා සමඟ විගණන වැඩ සැලැස්ම ඉදිරිපත් කිරීම අවශ්‍ය විය. M/s Barker Tilly විසින් ඔවුන්ගේ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේ දී ක්‍රමවේදය සහ වැඩ සැලැස්ම ඉදිරිපත් කර ඇත. එහි පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා අමුණා ඇත. | ප්‍රසම්පාදනය කල්තියා සැලසුම් කර, ලංසු සමඟ අවශ්‍ය සියලුම තොරතුරු කැඳවිය යුතු බව නිර්දේශ කෙරේ. |
| (ආ) අභ්‍යන්තර විගණන සේවාව ප්‍රසම්පාදනය කිරීමේ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාවට අනුව, ලංසු විවෘත කර තිබුණේ 2019 දෙසැම්බර් 18 වැනිදාය. කෙසේ වුවද, ලංසු ඇගයීම 2021 ජූනි 16 වැනි දින සිදු කර ඇත. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.4.1 මාර්ගෝපදේශයට අනුව, අවශ්‍ය සියලුම විධිමත් අනුමැති ලබා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ඉතිරි කර ගැනීම සඳහා යෝජනා ඇගයීම කඩිනමින් සිදු කළ යුතු වන්නේය. එබැවින්, ප්‍රසම්පාදන කාල රාමුවේ දක්වා ඇති කාලසීමාව තුළ යෝජනා ඇගයීමට ලක් කළ යුතුය. කෙසේ වුවද, ලංසු විවෘත කිරීමේ දිනයෙන් පසු මාස හයක ප්‍රමාදයකින් යෝජනා ඇගයීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | COVID 19 පැතිරීම හේතුවෙන්, නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය මත කාර්යාලීය කටයුතු බොහොමයක් සිදු කරන ලදී. එබැවින්, සාමාන්‍ය තත්ත්ව යටතේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉටු කිරීමට ගත වන කාලයට වඩා දීර්ඝ කාලයක් මෙම තත්ත්වය මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම සඳහා ගත වී ඇත. | කළමනාකාරීත්වය විසින් ප්‍රසම්පාදන කාලසටහන අනුගමනය කළ යුතු අතර සැලසුම් කළ ප්‍රසම්පාදන කාල රාමුවට අනුව ප්‍රසම්පාදනය සම්පූර්ණ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 16.5.9 මාර්ගෝපදේශයට අනුව, යෝජනා සඳහා ඉල්ලීම් කැඳවීමට පෙර ඇගයීමේ නිර්ණායක සහ උප නිර්ණායක තීරණය කළ යුතුය. අභ්‍යන්තර විගණකවරයා තෝරා ගැනීම සඳහා කෙටි ලැයිස්තුගත කිරීම සමඟ ලකුණු ලබා දීමේ ක්‍රමය සහ ඇගයීම් නිර්ණායක ලංසු විවෘත කිරීමෙන් පසුව නිර්වචනය කර තිබුණි. එම නිර්ණායක 2020 ජූනි 16 දින ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලදී. | යොමුකිරීමේ අනුදේශ යටතේ, ඇගයීම් නිර්ණායක සහ ලකුණු ලබා දීමේ ක්‍රමය පැහැදිලිව සඳහන් කර ඇති අතර, ඒවා යෝජනා සඳහා ඉල්ලීම (RFP) උපදේශකවරුන් වෙත යවන ලද අවස්ථාවේ දී උපදේශකවරුන් වෙත දන්වා ඇති අතර ඔබගේ දැන ගැනීම සඳහා පිටපතක් අමුණා ඇත. එම පදනම මත ඇගයීම සිදු කර ඇත. | කළමනාකාරීත්වය විසින් ප්‍රසම්පාදන සඳහා පූර්ව නිශ්චිත නිර්ණායක තීරණය කිරීම මගින් ප්‍රසම්පාදන කටයුතු නිසි ලෙස සැලසුම් කළ යුතුය. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයට අනුව, ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් උපරිම ආර්ථික වාසි සලසා ගැනීම, නිසි කලට වේලාවට ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරිම මගින් උසස් ගුණාත්මකභාවයක් සහිතව අවම පිරිවැයක් දැරීම සහතික කළ යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාව විසින් මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම මිලදී ගැනීම සඳහා පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. | කාර්යක්ෂම මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුමක් පැවතීමේ අවශ්‍යතාව කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇති අතර එය ක්‍රියාකාරී සැලසුමට සහ ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් කර ඇත. විසඳුමේ විශේෂාංග, සේවාදායකය සහ පරිපාලන ප්‍රවේශය, ආරක්ෂක විශේෂාංග සහ සත්‍ය බව සහතික කිරීම සහ මිල යනාදිය මත පදනම් වූ මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුමක් සඳහා ප්‍රසම්පාදනය සිදු කරන ලදී. ඒ අනුව, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කර ඇත. | ප්‍රසම්පාදනය සැලසුම් කිරීමේ අදියරේදී නිසි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 මාර්ගෝපදේශයට අනුව, රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව පත් කළ යුතුය. කෙසේ වුවද, එම කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූලව පත් කර තිබුණි ද යන්න පිළිබඳ සාක්ෂි විගණනය සඳහා ලබා දී නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය විසින් 2019 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව පත් කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ප්‍රසම්පාදන කමිටු පත් කළ යුතු වන්නේය. |
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.3.1 (ඇ) මාර්ගෝපදේශයට අනුව, එවැනි සියලුම ලේඛන අනුපිළිවෙළින් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් සහ ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා | විසඳුම් (මෘදුකාංග) ප්‍රසම්පාදනයට අදාළ ලේඛන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට පෙර සභාපති (විෂය විශේෂඥ) සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ තවත් සාමාජිකයෙකු සහ දෙපාර්තමේන්තු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ලංසු ලේඛන සකස් කර අනුමත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොට අනුමත කළ යුතු අතර, එම ලේඛනවල අන්තර්ගත කරුණු සම්බන්ධ සම්පූර්ණ වගකීම එම කමිටු දෙක භාර ගත යුතුය. කෙසේ වුවද, විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව, ලංසු විවෘත කිරීමෙන් පසුව ප්‍රසම්පාදන කමිටුව (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත් කර ඇති බැවින් ප්‍රසම්පාදන කමිටුව (PC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) විසින් ලංසු ලේඛන අනුමත කර නොතිබුණි. තවද, සියලුම ලංසු ලේඛන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබුණි. | ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පරීක්ෂා කර නිර්දේශ කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම ලෙස Board PAC සහ Octoplex සඳහා ලංසු ලබා දී ඇති පුද්ගලයන්ගෙන් මිල ගණන් 2 ක් ලැබී ඇත. මෘදුකාංගය සම්බන්ධ ප්‍රසම්පාදන තීරණය 192 වන රැස්වීමේදී කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කෙසේ වුවද, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සපයන ලද පිරිවිතර මත පදනම්ව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුමට අදාළ දෘඩාංගය ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසු කැඳවා ඇත. කෙසේ වුවද, අප විසින් මෙම ක්‍රියාවලිය විධිමත් කර ඇති අතර ලංසු කැඳවීමට පෙර ප්‍රසම්පාදන ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් සමාලෝචනය කරනු ලැබේ. | |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 මාර්ගෝපදේශයට අනුව, ලංසු කැඳවීමේ ආරාධනයෙහි ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු ප්‍රධාන යෝග්‍යතා උපමාන සහ සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා ඇතුළත්ව ලංසු හෝ මිල ගණන් පිළියෙළ කිරීමට විභව්‍ය ලංසුකරුවන්ට අවශ්‍ය වන උචිත සහ අදාළ මූලික තොරතුරු ඇතුළත් විය යුතුය. කෙසේ වුවද, සමස්ත පරිශීලකයින් සංඛ්‍යාව, නිෂ්පාදනයේ විශේෂාංග, තාර්කික ගෘහ නිර්මාණ ශිල්පයක් භෞතික පරිසරයකට සිතියම්ගත කිරීම, සේවාදායක සහ පාලක ප්‍රවේශය, ආරක්ෂක විශේෂාංග, සත්‍ය බව සහතික කිරීම, සේවාදායක පදනම සහ වලාකුළු පරිගණන අවකාශයේ කාලය වැනි සාමාන්‍ය තොරතුරු ලංසු ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | ලංසු ලේඛනවල ප්‍රසම්පාදනයට අදාළ සියලුම වැදගත් තොරතුරු ඇතුළත් විය යුතුය. |
| (ඌ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) මාර්ගෝපදේශයට අනුව, ප්‍රධාන | ප්‍රසම්පාදන සැලැස්මට දෘඩාංග සහ මෘදුකාංග යන ආකාර දෙකෙන්ම සමන්විත මණ්ඩල රැස්වීම් කළමනාකරණ විසඳුම ඇතුළත් විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට නොවැඩි කාල පරතරවලදී විධිමත්ව යාවත්කාලීන කළ යුතුය. කෙසේ වුවද, ipads සහ ඒ ආශ්‍රිත උපාංග ප්‍රසම්පාදන සැලැස්මට හෝ අයවැයට ඇතුළත් කර ඇති බව අපට නිරීක්ෂණය කළ නොහැකි විය. | | අවශ්‍යතාවලට අනුකූලව කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කළ යුතුය. |

## 3.5 ව්‍යාපෘති පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ (FSMP) ගිවිසුමට අනුව, ක්‍රියාත්මක කිරීමේ අස්තිත්වය විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලය මුළුල්ලේ, පසුව එළඹෙන සෑම මූල්‍ය වර්ෂයකදීම ව්‍යාපෘතියේ 2 (ඇ) සංරචකය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික වැඩ සැලැස්මක් සහ අයවැයක් අනුමැතිය ලබා ගැනීම සඳහා හැකි ඉක්මනින්, සෑම වසරකම නොවැම්බර් 30 දින පසු වීමට පෙර, ජාත්‍යන්තර සංවර්ධන සංගමයට (IDA) ලබා දිය යුතුය. කෙසේ වුවද, 2020 සහ 2021 වර්ෂ සඳහා වාර්ෂික වැඩ සැලසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම ලේඛන ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙත ඉදිරිපත් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු ද ලබා ගත නොහැකි වී තිබුණි. | අවශ්‍යතාවයට අනුකූල වෙමින්, වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැය ඒ ඒ වර්ෂයේ නොවැම්බර් 30 පසු වීමට පෙර මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (CPCU) වෙත යවා ඇත. අවශ්‍යතාවලට අනුකූල වෙමින් වර්තමානයේ ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රසම්පාදන අයවැය සමඟ වරින් වර ප්‍රසම්පාදන විනිමය විධිමත්ව ලුහුබැඳීමේ (STEP) ලෝක බැංකු පද්ධතියට උඩුගත කර ඇත. | කොමිෂන් සභාව විසින් ප්‍රසම්පාදනයේ දී විනිමය විධිමත්ව ලුහුබැඳීම සඳහා විගණනය වෙත ප්‍රවේශය ලබා දීම හෝ අදාළ ලේඛන විගණනය සඳහා ලබා දීම සිදු කළ යුතුය. |
| (ආ) මෙම ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් කිරීම සඳහා එ.ජ. ඩොලර් 945,450 ක් (SDR මිලියන 0.67 ක්) වෙන් කර තිබුණි. එසේ වුවද, මෙම මුදල් මෙම අරමුණ සඳහා භාවිත කර නොතිබුණි. | ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) සභාපතිවරයා ලෙස මූලකුරු සටහන් කර, ලෝක බැංකුව සහ මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (CPCU) අතර පැවති ව්‍යාපෘති සමාලෝචන රැස්වීම්වලට යොමු කර තිබුණු ලිපියේ සඳහන් කර ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසානයේ දී සිය රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර වෙන් නොකිරීමට තීරණය කර ඇති බවත් එබැවින්, ඔවුන් ලෝක බැංකුවෙන් තාක්ෂණික සහාය ලබා ගැනීමට අපේක්ෂා නොකරන බවත්ය.<br>ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදු කළ යුතු අතර බලපෑමක් සිදු කළ හැකි ක්‍රියාමාර්ග ද අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වෙන් කිරීම පිළිබඳ එහි යෝජනාව ඉදිරිපත් කළ පසු DLI සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වගකීම ආරම්භ වනු ඇත. ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් යෝජනාව ඉදිරිපත් කළේ නම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් යෝජනාව සමාලෝචනය කිරීම අවශ්‍ය වනු ඇති අතර DLI සාක්ෂාත් කර ගැනීම සඳහා කිසිදු විරෝධතාවක් නොදක්වන බව සඳහන් කරනු ඇත. කෙසේ වුවද, ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු කාර්යභාරය ඉටු කළ හැකි වන පරිදි, වෙන් කිරීම පිළිබඳ යෝජනාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් වෙන් කිරීම අත්හැර දැමීමට ගත් තීරණය තහවුරු කරන ලෙස අපි ඉල්ලා සිටියෙමු. ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) වෙතින් ප්‍රතිචාරයක් ලබා දෙන තුරු ඒ පිළිබඳ අපේක්ෂාවෙන් සිටින්නෙමු. කෙසේ වුවද, මේ වන විට එම ව්‍යාපෘතිය අවලංගු කර ඇත. | |
| (ඇ) | මෙම ව්‍යාපෘතිය යටතේ කොමිෂන් සභාවේ අධීක්ෂණ සහ නියාමන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වූ සවිස්තරාත්මක වැඩ සැලැස්ම විගණනයට ලබා දී නොතිබුණි. | අවශ්‍යතාවයට අනුකූල වෙමින් වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැය ඒ ඒ වර්ෂයේ නොවැම්බර් 30 දින පසු වීමට පෙර මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය (CPCU) වෙත ඉදිරිපත් කර ඇත. අවශ්‍යතාවලට අනුකූල වෙමින්, වර්තමානයේ සිදු වෙමින් පවතින ප්‍රසම්පාදන ඒවායේ අයවැය සමඟ වරින් වර ප්‍රසම්පාදන විනිමය විධිමත්ව ලුහුබැඳීමේ (STEP) ලෝක බැංකු පද්ධතියට උඩුගත කර ඇත. | කළමනාකාරීත්වය විසින් විගණනය සඳහා ඉල්ලා සිටින තොරතුරු ලබා දිය යුතුය. |
| (ඈ) | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, විශේෂඥයින් සහ උපදේශකයින්ගේ කාර්යයන් එකිනෙකට සම්බන්ධ විය යුතුය. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකයින් වරින් වර බඳවා ගෙන තිබුණු අතර, ව්‍යාපෘතියේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එම උපදේශකයින් අතර ප්‍රබල අන්තර් | ගිවිසුමේ / ප්‍රසම්පාදන සැලැස්මේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ලැබෙන ආදායමෙන් කොටසක් උපදේශන සේවා සඳහා යෙදවීමට අදහස් කරන ලදී. එම උපදේශන සේවා වූයේ:<br>i. ආයුගණනය පිළිබඳ ප්‍රවීණතාව<br>ii. රක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව | ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායමට නිසි සම්බන්ධීකරණයක් සහ සුදුසු ක්‍රියාමාර්ග තිබිය යුතුය. |

| | | |
|---|---|---|
| සම්බන්ධතාවක් පැවති බව නිරීක්ෂණය කළ නොහැකි විය. මෙම දුර්වල ව්‍යාපෘති කළමනාකරණය හේතුවෙන් අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගෙන නොතිබුණි. | iii.තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව<br>iv. මානව සම්පත් පිළිබඳ ප්‍රවීණතාව<br>v.ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා උපදේශන සමාගම.<br>ක්‍රියාකාරකම්වල ස්වභාවය හේතුවෙන් උපදේශන ධූර අතර යම් මට්ටමක අන්තර් සම්බන්ධතාවක් පැවතුණි. ඉහත සඳහන් උපදේශන ආයතනවල යොමුකිරීමේ අනුදේශ මඟින් අරමුණ සපුරාලීමේ සැලැස්ම පිළිබිඹු වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට උපදේශන ආයතන 2 ක් කුලියට ගැනීමට හැකි වූ නමුත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇති වූ යම් යම් බාධාවන් හේතුවෙන් ඉතිරි උපදේශන 3 ට අදාළව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට නොහැකි විය. | |
| (ඉ) 2022 මාර්තු 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයුගණක උපදේශකවරයා ඔහුගේ කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි. 2022 ජනවාරි 24 දිනට ආයුගණක උපදේශකවරයා විසින් පිළියෙළ කරන ලද "මේ දක්වා රක්ෂණ (ආයුගණක) ව්‍යාපෘතිය පිළිබඳ උපදේශකවරයාගේ තක්සේරුව" ලෙස නම් කර ඇති වාර්තාවට අනුව, කළමනාකාරිත්වය විසින් ආයුගණක උපදේශකවරයාගේ නිර්දේශ පිළිබඳ අදහස් දක්වා නොතිබීම, ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට සහ පසු විපරම් කිරීමට කොමිෂන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබීම, සංරචක නායකයින් ඔහුගේ යෝජනාවලට සාධාරණ තර්ක සහිතව ප්‍රතිචාර නොදැක්වීම, මෙම ව්‍යාපෘතිය යටතේ බඳවා ගැනීම අවශ්‍ය වූ රක්ෂණ විශේෂඥයින්ගෙන් කිසිදු සහයෝගයක් ලබා ගැනීමෙන් තොරව ආයුගණක උපදේශකවරයාගේ කටයුතු සිදු කර තිබීම, රක්ෂණ සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් සැපයීමට කොමිෂන් සභාව බැඳී සිටි නමුත්, කොමිෂන් සභාව විසින් එසේ රක්ෂණ සහ තොරතුරු තාක්ෂණ විශේෂඥයන් සපයා නොතිබීම සහ නිසි පැහැදිලි කිරීම් ලබා නොදී ඔහුගේ උපදෙස් | උනන්දුව ප්‍රකාශ කිරීම (EOI) සඳහා කරන ලද ආරාධනාවට ප්‍රතිචාර දක්වමින්, යොමුකිරීමේ අනුදේශවල දක්වා ඇති සියලුම කාර්යයන් ඉටු කිරීමට එකඟ වෙමින් උපදේශකවරයා තම යෝජනාව ඉදිරිපත් කරන ලදී. කෙසේ වුවද, කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමෙන් පසුව, පිළිගත නොහැකි විවිධ හේතු පවසමින් ඇතැම් කාර්යයන් ඉටු කිරීමට ඔහු එකඟ නොවීය. උපදේශකවරයා වෙත යොමු කරන ලද ඇගයීම් වාර්තාව උපදේශකවරයා විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ නිසා අපි ඒ සඳහා ප්‍රතිචාර නොදැක්වූයෙමු. එමෙන්ම, එම අවස්ථාවේ ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් ඔහුට නොතිබුණි. භාණ්ඩාගාර ලේකම්වරයා වෙත සහ ජනාධිපති ලේකම්වරයා වෙත ඔහු විසින් පැමිණිලි ඉදිරිපත් කර තිබුණු නිසා ඔහුගේ වාර්තාවේ පිටපතක් මුදල් අමාත්‍යාංශය හරහා අපට ලැබී තිබුණි. ඒ අනුව, කොමිෂන් සභා මට්ටමින් මේ පිළිබඳව සාකච්ඡා පවත්වන ලද අතර වැඩිදුර සමාලෝචනය සඳහා විගණන කමිටුව වෙත යොමු කරන ලදී. | කොමිෂන් සභාව විසින් ආයුගණක උපදේශක සමඟ ගිවිසුමේ නියමයන් ක්‍රියාත්මක කළ යුතු අතර එකඟ වූ කාර්යය ඉටු කර ගැනීම හෝ කොන්ත්‍රාත්තුවේ නියමයන් ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. |

නොසලකා හැර තිබීම ඔහු විසින් මේ අන්දමින් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හේතු වී තිබුණි. ඉහත නිරීක්ෂණ මත පදනම්ව, ආයුගණක උපදේශකවරයා වෙත එ.ජ. ඩොලර් 168,000 ක් ගෙවා තිබීම ආර්ථික නොවන ගනුදෙනුවක් බව නිරීක්ෂණය වේ.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සියලුම සාමාජිකයන් විසින් ඔහුගේ අසාධාරණ චෝදනා සම්බන්ධයෙන් විගණන කමිටු මට්ටමින් සවිස්තරාත්මකව සාකච්ඡා පවත්වන ලදී. මෙය සමථයකට පත් කිරීමේ අරමුණින් යුක්තව ඔහු ලබා දුන් ඇතැම් වාර්තාවලට සමභාග ගාස්තු ගෙවීමට විගණන කමිටුවේදී තීරණය විය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට වාර්තාවේ සඳහන් කරුණුවලට එකඟත්වය පළ කළ නොහැකි විය. තවද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඔහුගේ උපදෙස් නොසලකා හැර නොතිබුණි. අදාළ පාර්ශ්ව සමඟ සාකච්ඡා කිරීම සඳහා ඔහු විසින් බොහෝ අංශ සම්බන්ධයෙන් උපදේශන පත්‍රිකා ලබා දීම අවශ්‍ය වූ නමුත්, ඔහු විසින් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඔහු රක්ෂණ විශේෂඥයෙකුගේ කාර්යයන් ඉටු කිරීමට සුදුසුකම් ඇති බවට අදහස් දක්වමින් අමතර මුදලක් ද ඉල්ලා සිටියේය. කෙසේ වුවද, අපට ඔහුගේ ඉල්ලීමට එකඟ විය නොහැකි විය. කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුව, එක් වරක්වත් ලංකාවට පැමිණීමටද ඔහු අපොහොසත් විය. ඔහු තම වීසා බලපත්‍රය ගැන තර්ක කරමින් කාලය හා සම්පත් නාස්ති කළේය. ඔහුගේ වාර්තා බොහොමයක අවසන් කිරීමෙන් පසුව කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පෙර සාකච්ඡාවට ගත යුතු තවත් කරුණු තිබුණි. කෙසේ වුවද, ඇතැම් වාර්තා ඉදිරිපත් කර ක්‍රියාත්මක කරන ලදී. සංරචක 15(ආ) යනු ආයුගණක උපදේශකවරයකු විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සඳහා ආධාරක සේවා සහ උපදෙස් සැපයිය යුතු තොරතුරු තාක්ෂණ සමාගම යටතේ වූ කාර්යයක් විය. ආරම්භයේ දී සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පාලනයෙන් ඔබ්බට ගිය හේතු නිසා තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය ප්‍රදානය කළ නොහැකි විය. එබැවින් ආයුගණක උපදේශකවරයා වෙත කරන ලද ගෙවීම ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස සැලකිය නොහැකිය. වාර්තා ශ්‍රී ලංකා

| | | | |
|---|---|---|---|
| | | රක්ෂණ නියාමන කොමිෂන් සභාව සතු දේපළ වන අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ආයුගණක උපදේශකවරයකු කුලියට ගන්නා අවස්ථාවල දී, පිළිගත් සියලුම වාර්තාවල ඇතුළත් වන උපදෙස් කොමිෂන් සභාව සඳහා උපයෝගී කර ගනු ලබයි. වර්තමාන කොමිෂන් සභාව මගින් පවා ආයුගණක උපදේශකවරයකු බඳවා ගැනීමට ඍජුව මැදිහත් වී ඇති නමුත්, අඩු වැටුප් ව්‍යුහ පැවතීම හේතුවෙන් එය සාර්ථක වී නොමැති බැවින් මෙය වෙනම සංවාදයට ගත යුතු කරුණකි. | |
| (ඊ) | විගණනය සඳහා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, ලබා දී ඇති වැඩ සැලැස්මට අනුව ආයුගණක උපදේශකවරයා විසින් සංරචක 3ක් සඳහා කිසිදු වාර්තාවක් නිකුත් කිරීම හෝ කාර්යයන් ඉටු කිරීම හෝ සිදු කර නොතිබුණි. එබැවින්, සංරචක 17 අතරින් සංරචක 14 ක් සඳහා අවසන් සහ කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. විගණනය සඳහා ලබා ගත හැකි වූ විස්තරවලට අනුව, එම වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර අදහස් දැක්වීම, සංවර්ධනය කිරීම සහ නියාමකයකු ලෙස ප්‍රතිපත්ති සැකසීම සම්බන්ධයෙන් වගකිව යුතු අදාළ පාර්ශ්ව සමඟ මෙම වාර්තා සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා ඇති බවට කිසිදු සාක්ෂියක් නොමැති විය. | කළමනාකාරිත්වය විසින් කිසිදු පිළිතුරක් ලබා දී නොමැත. | කොමිෂන් සභාව විසින් එකඟ වූ කාර්යය ආයුගණක උපදේශකවරයා ලවා ඉටු කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (උ) | වැඩ සැලැස්මට අනුව, ආයුගණක උපදේශකවරයාගේ කාර්යය රක්ෂණ උපදේශක සහ තොරතුරු තාක්ෂණ උපදේශක වැනි වෙනත් උපදේශකයින් සමඟ සම්බන්ධ වී තිබුණි. එබැවින්, එම උපදේශකයින් අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට කොමිෂන් සභාව විසින් ඔවුන් වෙත පහසුකම් සපයා නොමැති බව අපට නිරීක්ෂණය විය. | ගිවිසුමේ / ප්‍රසම්පාදන සැලැස්මේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ලැබෙන ආදායමෙන් කොටසක් උපදේශන සේවා සඳහා යෙදවීමට අදහස් කරන ලදී. එම උපදේශන සේවා වූයේ:<br>i. ආයුගණනය පිළිබඳ ප්‍රවීණතාව<br>ii. රක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව<br>iii. තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රවීණතාව<br>iv. මානව සම්පත් පිළිබඳ ප්‍රවීණතාව<br>v.ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව | ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම මගින් උපදේශකවරුන් අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු අතර විගණනය සඳහා ඉල්ලා සිටින තොරතුරු ද ඉදිරිපත් කළ යුතුය. |

| | |
|---|---|
| | නවීකරණය කිරීම සඳහා වූ උපදේශන සමාගම.<br>ක්‍රියාකාරකම්වල ස්වභාවය හේතුවෙන් උපදේශක ධූර අතර යම් මට්ටමක අන්තර් සම්බන්ධතාවක් පැවතුණි. කෙසේ වුවද, මානව සම්පත් විශේෂඥයා සහ ආයුගණක විශේෂඥයා යන දෙදෙනාම එකම කාලසීමාවක් තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සේවය කළ බැවින්, මානව සම්පත් විශේෂඥයා ආයුගණක විශේෂඥයා සමඟ සාකච්ඡා පවත්වා තිබුණි. |
| (ඌ) මානව සම්පත් උපදේශකවරයා වෙත පවරා ඇති කාර්යයට අනුව, උපදේශකවරයාගේ කාර්යය ඉටු කිරීමේදී සේවාලාභියාගේ අනාගත වර්ධනයන් පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා උපදේශකවරයා විසින් ව්‍යාපෘතිය යටතේ කුලියට ගත් අනෙකුත් උපදේශකවරුන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම උපදේශකවරයාට පැවරෙන අවසාන කාර්යය වේ. ව්‍යාපෘතියේ ප්‍රගතියට අනුව, ආයුගණක උපදේශකවරයා පමණක් පත් කර තිබුණි. මානව සම්පත් උපදේශකවරයාට මෙම ව්‍යාපෘතියේ අනෙකුත් උපදේශකවරුන් සම්බන්ධ කර ගැනීමට සහ සාකච්ඡා කිරීමට හැකි වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත. එබැවින්, උපදේශකවරුන් අතර නිසි සම්බන්ධීකරණයක් සහ සන්නිවේදනයක් නොමැතිකම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇත. | ආයුගණක විශේෂඥයා හැර වෙනත් උපදේශකවරුන් නොමැති වීම හේතුවෙන්, මානව සම්පත් විශේෂඥයා විසින් ආයුගණක විශේෂඥයා සමඟ සාකච්ඡා පවත්වා තිබුණු අතර මානව සම්පත් විශේෂඥයා විසින් ඔහුගේ කොන්ත්‍රාත් කාලය තුළ ඔහුගෙන් අපේක්ෂා කළ කාර්යය නිසි ලෙස ඉටු කර තිබුණි. තවද, අනෙකුත් සියලුම විශේෂඥයන්ගේ යොමුකිරීමේ අනුදේශ පිළිබඳව සහ මානව සම්පත් ප්‍රවීණතාව පැවරුමේ අවශ්‍යතාව පිළිබඳව මානව සම්පත් විශේෂඥයා විසින් අවබෝධ කර ගෙන තිබුණි. ඔහුගේ සියලු වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර තිබුණු අතර ඔහු සියලුම කොමිෂන් සභා සාමාජිකයින් සමඟ සාමූහිකව සහ තනි තනිව බොහෝ සාකච්ඡා පවත්වා තිබුණි. ඇතැම් වාර්තා ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් වාර්තා පිළිබඳව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට පෙර මානව සම්පත් අනුකමිටුවේ දී සාකච්ඡා කිරීමට නියමිතය. |
| (එ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන සහ අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා උපදේශක සමාගම් කුලියට ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය තවදුරටත් අඛණ්ඩව පැවති බව සනාථ කිරීමට කිසිදු සාක්ෂියක් නොමැත. 2021 ඔක්තෝබර් 27 දිනැති මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ (CPCU) | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ලෝක බැංකුවෙන් කිසිදු විරෝධතාවක් ඉදිරිපත් නොවීමට යටත්ව, ඉන්දියාවේ ප්‍රයිස් වෝටර්හවුස් කූපර්ස් (පුද්ගලික) සමාගමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට නිර්දේශ කිරීමේ අදියර දක්වා ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය අඛණ්ඩව සිදු කර ඇත. ඉන් අනතුරුව, |

රැස්වීමේ රැස්වීම් වාර්තාවට අනුව, මූල්‍ය යෝජනා ඇගයීමට ලක් කර උපදේශකවරයෙකු තෝරාගෙන තිබුණි. කෙසේ වුවද, මේ දක්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. තවද, ඉහත අදියර දක්වා ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මෙම ප්‍රසම්පාදනය සඳහා දරන ලද පිරිවැය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

ලෝක බැංකුව මගින් ඒ සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය අවලංගු කර ඇති අතර එය ඉදිරියට පවත්වා ගෙන යාමට නොහැකි විය. මාධ්‍ය නිවේදන ප්‍රසිද්ධ කිරීම සඳහා දරන ලද පිරිවැය FSMP ව්‍යාපෘතිය මගින් වැය කර ඇත.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මගින් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීමෙන් සහ වැටුප් හා සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් වළකින ලෙස සියලු අමාත්‍යාංශ සහ අනෙකුත් අදාළ බලධාරීන් වෙත උපදෙස් දී තිබුණි. කෙසේ වුවද, කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සේවක සංඛ්‍යාව වැඩි කිරීම, උසස්වීම් ලබා දීම සහ වැටුප් වැඩි කිරීම සිදු කර තිබුණි. | ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාව 2001 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. 2005 වර්ෂයේ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයින් ද්විතීයනය කිරීමේ පදනම මත අමතර දීමනාවක් සහිතව ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාවට පත් කරන ලදී. 2005 වර්ෂයේ සිට සේවක සංඛ්‍යාව, වැටුප් පරිමාණ, අනෙකුත් පාරිශ්‍රමික ආදිය වෙන වෙනම සැලසුම් කර ඇත. සංවිධානයේ පරිණතභාවය සහ වගකීම් පුළුල් වීම හේතුවෙන් සංවිධානයේ සේවක සංඛ්‍යාව සහ වැටුප් සංශෝධනය කර උසස්වීම් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වී තිබුණි. සංවිධානයේ ආරම්භයේ සිටම විධායක තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ විධායක දක්වා (සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සිදු කරන පරිදි) උසස් කිරීම හැර වෙනත් උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වී නොතිබුණි. මේ හේතුව මත කාර්ය මණ්ඩලයට දිගු කලක් එකම තනතුරේ රැඳී සිටීමට සිදු වූ අතර සේවක පිරිවැටුම ද ඉතා ඉහළ මට්ටමක පැවතුණි. (2005 සිට 2018 දක්වා කාර්ය මණ්ඩලය 50% කට ආසන්න ප්‍රමාණයක් ඉල්ලා අස්වී ඇත). රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 5 (ඉ), 10 (1) සහ 10 (2) වගන්තිවලට අනුව, කොමිෂන් සභාවට එහි කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි කොමිෂන් සභාව සලකන යම් නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය හැකි අතර එම නිලධරයන්ට හා සේවකයන්ට කොමිෂන් සභාව විසින් නිර්ණය කරනු ලබන යම් ආකාරයකින් හා යම් අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබීමට බලය ලබා දී ඇත. පාර්ලිමේන්තුව විසින් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල අනුව කොමිෂන් සභාව කටයුතු කර ඇත. | කොමිෂන් සභාව විසින් අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද, අදාළ වන චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |

| | | |
|---|---|---|
| | ඒ අනුව, කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත පාරිශ්‍රමික කමිටුවක් පත් කරන ලදී. පාරිශ්‍රමික කමිටුවේ නිර්දේශ 2018/07/03 දිනැති අංක 183/47 පත්‍රිකාව මගින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර එම නිර්දේශ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී. කොමිෂන් සභාව විසින් එය අනුමත කර, 2019 ජුනි 30 දිනට එහි කාර්තුමය සේවක සංඛ්‍යා තොරතුරු පත්‍රිකාව මගින් ක්‍රියාත්මක කිරීමෙන් පසුව එම වෙනස්කම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. | |
| (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොමිෂන් සභාව විසින් තනතුරු සංඛ්‍යාව දහතුනක් (13) කින් වැඩි කර තිබුණි. | මණ්ඩලය / කොමිෂන් සභාව ආරම්භයේ සිටම විධායක නිලධාරීන් ජ්‍යෙෂ්ඨ විධායක තනතුරට උසස් කිරීම හැර වෙනත් උසස්වීම් යෝජනා ක්‍රමයක් නොතිබීම හේතුවෙන් කාර්ය මණ්ඩලය එකම තනතුරේ බොහෝ කාලයක් රැඳී සිටීම සැලකිල්ලට ගනිමින්, කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් කළ පරිදි තනතුරු නැවත නම් කර ඇත. තනතුරු නැවත නම් කිරීම නිසා මුළු සේවක සංඛ්‍යාවේ වැඩි වීමක් සිදු නොවේ. පීඊඩී 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දෙනු ඇත. | කොමිෂන් සභාව විසින් මානව සම්පත් කාර්යයන් සඳහා අදාළ බලධාරීන්ගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) 2021 දෙසැම්බර් 31 වන විට කොමිෂන් සභාව විසින් සේවකයින් හතළිස් නව දෙනෙකු (49) සේවයේ යොදවා තිබුණි. මෙම තනතුරු අතරින්, අධ්‍යක්ෂ තනතුරු එක (01) ක්, කළමනාකරු / සහකාර කළමනාකරු තනතුරු දහතුන (13) ක්, ලේකම් තනතුරු එක (01) ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි. | කොමිෂන් සභාව විසින් තනතුරු 57 ක් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන ඇත. කළමනාකරු / සහකාර කළමනාකරු තනතුරු විධායක තනතුර සඳහා උසස් කිරීමේ ශ්‍රේණි පමණක් වන අතර මුළු සේවක සංඛ්‍යාවට එයින් කිසිදු බලපෑමක් සිදු නොවේ. සියලුම තනතුරු සඳහා අමාත්‍යාංශ අනුමැතිය මත බඳවා ගැනීම් සිදු කර ඇත. නව තනතුරු සඳහා බඳවා ගැනීමට පෙර ලබා ගත් අනුමැතිය - ඇමුණුම 14<br>පීඊඩී 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දෙනු ඇත. | කොමිෂන් සභාව විසින් මානව සම්පත් කාර්යයන් සඳහා අදාළ බලධාරීන් විසින් ලබා දී ඇති, අදාළ වන චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |
| (ඈ) නීතිපතිවරයාගේ මතය මත පදනම් වෙමින් කොමිෂන් සභාව විසින් සේවක සංඛ්‍යාව සහ වැටුප් ක්‍රමය ඔවුන් විසින්ම තීරණය කර තිබුණි. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2019 මැයි 31 දිනැති සංදේශය මගින්, 2018 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, කොමිෂන් සභාවේ කාර්ය | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පාරිශ්‍රමික සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුව විසින් පසුගිය වසර 13 අතරින්, 2012 වර්ෂයේ දී පමණක් එක් වැටුප් සංශෝධනයක් ලබා දී ඇති බවත්, එබැවින් කාර්ය මණ්ඩල වැටුප් වෙළඳපොළ අනුපාත සමඟ සැසඳිය නොහැකි බවත්, විශේෂයෙන්ම මූල්‍ය අංශයේ අනෙකුත් නියාමකයින් විසින් පිරිනමනු ලබන පාරිශ්‍රමික සමඟ කාර්ය මණ්ඩල වැටුප් සැසඳිය නොහැකි බවත් සඳහන් කරන ලදී.<br>මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, විමර්ශන, ඒකාබද්ධ කිරීම් | කොමිෂන් සභාව විසින් සේවක සංඛ්‍යාව සහ වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලය සඳහා වැටුප් ගැළපීම් සිදු කිරීම, සේවක මණ්ඩල සංශෝධනය, රු.7,800 ක් වන ජීවන වියදම් දීමනාව ගෙවීම, මූලික වැටුපෙන් 15% ක නිපුණතා දීමනාවක් සහ රු. 12,500 ක විශේෂ ජීවන වියදම් දීමනාවක් ගෙවීම සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා තිබුණි. කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ආයතනයක් වුවද, කොමිෂන් සභාව විසින් එහි සේවක සංඛ්‍යාව තීරණය කිරීමට සහ වැටුප් හා දීමනා වැඩි කිරීමට මහා භාණ්ඩාගාරයෙන් නිෂ්කාශනය හෝ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | සහ පවරා ගැනීම් යන සන්දර්භය තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ දිනෙන් දින ඉහළ යන සංකීර්ණ අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමටත්, දැනට සිටින සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩලය රඳවා තබා ගැනීමටත් හැකි ස්ථාවරයක කොමිෂන් සභාව නොසිටියි. නියාමකයාගේ ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ අදාළතාව ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර රක්ෂණ පිළිවෙත්වලට අනුකූල වීම සඳහා වත්මන් රාමුව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද පවතී. තවද, අනෙකුත් නියාමකයින් මෙන්ම, මනා වන්දි පැකේජයක් තිබීම සම්බන්ධ පහත කරුණු ඉස්මතු කිරීමට අපි අපේක්ෂා කරමු. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ පිළිගත් ආයතනවල කලින් වැඩ කිරීමෙන් ලබා ගත් පළපුරුද්දට අනුව වන අතර සියලුම විධායක සහ සහකාර කළමනාකරු තනතුරු සහ ඒවාට ඉහළ කාර්ය මණ්ඩල තනතුරු සඳහා යෝග්‍ය සුදුසුකම් ලබා තිබිය යුතුය. පනතේ විධිවිධානවලට අනුව, ව්‍යවස්ථාදායකය මගින් ස්ථාපිත කරන ලද ආයතනයට යම් ස්වාධීනත්වයක් ලබා දී ඇත.<br>ඇමුණුම 13 - නීතිපතිවරයාගේ මතය අමුණා ඇත. වැටුප් සංරචකය කොමිෂන් සභාවේ මුළු ආදායමෙන් 24% ක් පමණ වේ. පීඊඩී 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දෙනු ඇත. | |
| (ඉ) | 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2018 ට පටහැනිව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා නොගෙන, නීතිපතිවරයාගේ මතය මත පදනම්ව, 2019 වර්ෂයේ දී කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා ඉහළ නංවා තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින භාණ්ඩාගාර නියෝජිතයා මේ සම්බන්ධයෙන් තම ස්වාධීන මතය අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වමින් මහජන යහපත සුරක්ෂිත කිරීමට අවශ්‍ය | පාරිශ්‍රමික කමිටුව විසින් කරන ලද අධ්‍යයනයක් මත පදනම්ව සහ ඔවුන්ගේ නිර්දේශ මත කොමිෂන් සභාවේ ද අනුමැතිය ඇතිව වැටුප් සංශෝධනය කර ඇත. කොමිෂන් සභාව විසින් ගෙන ඇති නෛතික ස්ථාවරය නීතිපතිවරයාගේ මතය මගින් තහවුරු වී තිබේ. වැටුප් ව්‍යුහ සංශෝධනය කිරීමේ තීරණයට කොමිෂන් සභාව විසින් ඒකමතිකව එකඟ වී ඇත. වැටුප් සංරචකය කොමිෂන් සභාවේ මුළු ආදායමෙන් 24% ක් පමණ වේ.<br>පීඊඩී 01/2021 ප්‍රකාරව මුදල් අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දෙනු ඇත. | කොමිෂන් සභාව විසින් සේවක සංඛ්‍යාව සහ වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඊ) 2010 වර්ෂයේ සිට මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව කාර්යසාධන දිරි දීමනාවක් ගෙවා තිබුණි. | දැනට පවතින කාර්යසාධන ඇගැයීමේ ක්‍රමය විවිධ කාර්යසාධන ඇගැයීම් ක්‍රම පරීක්ෂා කිරීමෙන් පසුව ක්‍රියාත්මක කර ඇති අතර සේවකයාගේ කාර්යසාධනය බොහෝ අංශ මගින් ආවරණය කර ඇත. කොමිෂන් සභාව විසින් වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක කරන ලද කාර්යසාධනය පදනම් කර ගත් දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයට අමාත්‍යාංශය විසින් කිසිදු විරෝධතාවක් ඉදිරිපත් කර නොමැත. ශ්‍රී ලංකා රක්‍ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කාර්යසාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සහ ඒ සඳහා කරන ලද සියලුම සංශෝධන කලින් කලට මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. කෙසේ වුවද, පීඊඩී 01/2021 අනුව ක්‍රියා කරනු ඇත. | කොමිෂන් සභාව විසින් කාර්යසාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය. |
| (උ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යසාධනය ඇගයීම සභාපතිවරයා විසින් සිදු කර තිබුණි. මෙමගින් කොමිෂන් සභාවේ ප්‍රබල තනතුරු දෙකක් අතර ගැටුමක් ඇති විය හැකි අතර අයහපත් තීරණ ගැනීමටද එය හේතු විය හැකිය. මනා පරිචය වන්නේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යසාධනය කොමිෂන් සභාව විසින් ඇගයීමට ලක් කිරීමයි. | ඉහත සඳහන් කළ පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ආසන්නතම අධීක්ෂක නිලධාරියා වශයෙන්, සභාපතිවරයා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය පිළිබඳව ඇගයුම්කරු වශයෙන් ඍජුවම ඇගයීම සිදු කරනු ලබයි. මානව සම්පත් උපදේශකවරයා විසින් ද ඇගයුම්ලාභියා සහ ඇගයුම්කරු සම්මුඛව සිට ඇගයීම් සිදු කළ යුතු බව නිර්දේශ කර තිබුණි. | අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවට වගකිව යුතු අතර සමස්තයක් ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යසාධනය කොමිෂන් සභාව විසින් ඇගයීමට ලක් කරනු ලබන්නේය. |
| (ඌ) දිරි දීමනා ගෙවීම සේවකයා ලබා ගත් ලකුණු සමඟ ඍජුව ගැළපී නොතිබුණි. ලබා ගත් ලකුණු පරාසය මත පදනම්ව එය ගෙවනු ලැබේ. එය සේවකයාගේ පැත්තෙන් අසාධාරණයක් වේ. උදාහරණයක් ලෙස, දිරි දීමනා ගෙවීමේදී ලකුණු 81ක් ලබාගත් සේවකයෙකුට සහ ලකුණු 100 ක් ලබාගත් සේවකයකුට සමානව සලකා තිබීම. | දිරි දීමනා ගෙවීම කාණ්ඩ 4 කින් ලකුණු පරාසයට සම්බන්ධ කර ඇත. ඉහළම ලකුණු පරාසයක් ලබා ගත් සේවකයින්ට කාර්ය සාධන දිරි දීමනාවෙන් 100% ක් ලැබේ. සාමාන්‍යයෙන්, ලකුණු 80% ට වඩා වැඩි ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් විශිෂ්ට කාර්යසාධනයෙන් යුත් සේවකයන් ලෙස සලකනු ලබන අතර 40% ට වඩා අඩු ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් දුර්වල කාර්යසාධනයෙන් යුත් සේවකයන් වශයෙන් සැලකේ.<br>මෙම ඇගයීමේදී එම සංකල්පයම භාවිතා කර ඇත. FSMP ව්‍යාපෘතියේ මානව සම්පත් උපදේශකවරයාගේ උපදෙස් මත අපි නව දිරිගැන්වීමේ ක්‍රමයක් අනුගමනය කරන්නෙමු. එයට අනුව, දිරි දීමනා ගෙවීම තනි පුද්ගල ස්මාර්ට් අරමුණු මත පදනම් වන අතර ගෙවීම් ඔවුන්ගේ කාර්ය සිද්ධි | දිරි දීමනා ගෙවීම සේවකයා විසින් ලබා ගත් ලකුණු සමඟ ඍජුව ගැළපිය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | මත පදනම්ව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. | |
| (එ) | අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යසාධන ඇගයුම් ආකෘතිපත්‍රය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන ඇගයුම් ආකෘතිපත්‍ර පුද්ගලික ලිපිගොනුවල ගොනු කර ඇති අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිගොනුව සභාපතිවරයා භාරයේ තබා ඇත. විගණනය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පුද්ගලික ලිපිගොනුව සහ කාර්යසාධන ඇගයීම් නොලැබීම පිළිබඳව ඒවා විගණනයට ලබා දීමට හැකියාව තිබුණු DFA හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර නොතිබුණු අතර, ඒවා නොලැබීම පිළිබඳව දැන ගැනීමට ලැබුණේ යොමුව යටතේ ලැබී තිබුණු ලිපියෙන් පමණි. | ඉල්ලා සිටින තොරතුරු විගණනය අතරතුර නියමිත වේලාවට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඒ) | නිලධාරීන්ගේ පුද්ගලික ලිපිගොනුවල රාජකාරි ලැයිස්තු නොතිබුණි. එබැවින්, ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක (KFIs) සකස් කර කාර්යසාධනය ඇගයීමට ලක් කළේ කෙසේද යන්න පැහැදිලි නැත. | ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) මනිනු ලබන්නේ සේවකයින්ගේ රැකියා විස්තරවලට (JDs) සමාන ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රවලට (KRAs) එදිරිව නියම කර ඇති කටයුතු / ක්‍රියාකාරකම් මත පදනම්වය. සෑම සේවකයෙකු සඳහාම වාර්ෂිකව ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (KRAs) නියම කර ඇත. කෙසේ වුවද, මානව සම්පත් උපදේශකවරයා විසින් ඉලක්කගත සංවිධානය සඳහා රැකියා විස්තර (JDs) කෙටුම්පත් කර ඇති අතර එම රැකියා විස්තර (JDs) මත පදනම්ව නව රැකියා විස්තර (JDs) කාර්ය මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබේ. | කොමිෂන් සභාවේ සියලුම සේවකයින් සඳහා රැකියා විස්තර තිබිය යුතු අතර ඔවුන්ගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම සඳහා එම රැකියා විස්තර සලකා බලනු ලැබේ. |
| (ඔ) | දිරි දීමනා ගෙවීමේ යෝජනා ක්‍රමයේ දිරි දීමනා ගෙවීමේ පදනම වූ මාස එකක (01) මූලික වැටුප මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2019 වර්ෂයේ සිට දිරි දීමනා ගෙවීමේ පදනම මාස එකහමාරක (1 ½) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මේ හේතුවෙන් මුළු දිරි දීමනාව රු. 4,605,381 කින් වැඩි වී ඇති අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 105% ක වැඩි වීමකි. | කාලසීමාව සඳහා කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් එහි 195 වන රැස්වීමේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය පාදක දිරි දීමනාව වශයෙන් උපරිම වශයෙන් මාස 1.5 ක දළ වැටුපක් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලදී. කොමිෂන් සභා තීරණය මත ගෙවීම් සිදු කර ඇත. | මහා භාණ්ඩාගාරයේ අනුමැතියට අනුව දිරි දීමනා ගෙවීමේ යෝජනා ක්‍රමය සඳහා වෙනස්කම් සිදු කළ යුතුය. |
| (ඕ) | සියලුම සේවකයින් අවසාන ඇගයීම සඳහා 100% ලකුණු ලබා ගෙන තිබුණි. එබැවින් කොමිෂන් සභාව මගින් යථාර්ථවාදී කාර්යසාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ. | පවතින කාර්යසාධන ඇගයීම් ක්‍රමයට අනුව, කාර්යසාධන නිර්ණායක ලකුණු සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්, ප්‍රධාන ක්‍රියාකාරී දර්ශක සහ ප්‍රධාන හැසිරීම් දර්ශකවල එකතුවකි. ලකුණු පරාසය 80 - 100 ක් වේ නම්, එය ප්‍රතිලාභ පරිමාණය 100 යටතේ සලකනු ලැබේ. 2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විවිධ කාර්යසාධන ලකුණු ලබා ගත්හ. ඉකුත් වර්ෂවල | කොමිෂන් සභාව මගින් යථාර්ථවාදී කාර්යසාධන ඇගයීම් ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඇතැම් කාර්යමණ්ඩල සාමාජිකයන් කාර්යසාධන නිර්ණායක ලකුණු 80 කට වඩා අඩුවෙන් ලබාගෙන තිබුණි. එම නිසා, "යථාර්ථවාදී කාර්යසාධන ඇගයීමක් සිදු කර ඇති බවක් නොපෙනේ" යන අදහස් දැක්වීම අපි පිළිනොගන්නෙමු. | |
| (ක) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14.2 වගන්තියට අනුව සකස් කරන ලද කාර්ය පටිපාටි සංග්‍රහය මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර ඉන් අනතුරුව ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟතාව ලබා ගත යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාවේ පරිපාලන කාර්ය සංග්‍රහය මහා භාණ්ඩාගාරය මගින් අනුමත කර නොතිබුණි. එබැවින්, රු. 1,639,753 ක් වූ ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම නිසි අධිකාරියක් නොමැතිව සිදු කර ඇත. | යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ මත පදනම්ව ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම ඇතුළත් පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. මූලික කාර්ය පටිපාටි සංග්‍රහය 2012 ඔක්තෝම්බර් 23 දින අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර වරින් වර සිහිකැඳවීම් යවන ලදී. පසුව පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහයට සිදු කරන ලද වෙනස්කම් ද දැනුම් දෙන ලදී. අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටියේ ගැටළු පැවතීම හේතුවෙන් පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහය සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයක් පවතින බව 2018 අප්‍රේල් 05 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් කොමිෂන් සභාවට දන්වන ලදී. එබැවින්, කොමිෂන් සභාව විසින් පරිපාලන කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර ඇත. | කොමිෂන් සභාව සඳහා කාර්ය පටිපාටි සංග්‍රහ සකස් කිරීමේදී කොමිෂන් සභාව විසින් නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සැප්තැම්බර් 19 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (CAO) විසින් පත් කරන ලද සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCD) විසින් 2007 අගෝස්තු මාසයේ නිකුත් කරන ලද උපදේශකවරුන් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කරවීම සඳහා වන මාර්ගෝපදේශයට අනුව, ප්‍රසිද්ධ වෘත්තියේ නිරත වන විගණන සමාගමකින් අභ්‍යන්තර විගණන සේවාව ප්‍රසම්පාදනය කර ඇත. | දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුව (CPCD) පත් කර ඇත්තේ මාර්ගෝපදේශවලට අනුකූල වන පරිදිය. කෙසේ වුවද, විගණනය මගින් ලබා දී ඇති අදහස් දැක්වීම් සැලකිල්ලට ගනිමින්, විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ සහ කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන 2022 සිට 2024 දක්වා වන වර්ෂ සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් කටයුතු කරනු ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු තෝරා ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් පැවතිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු උපදේශක ප්‍රසම්පාදන කමිටුවේ (CPCD) සාමාජිකයින් සිව්දෙනා අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ මූල්‍ය හා පාලන ඇතුළු කොමිෂන් සභාවේ ප්‍රධාන සේවකයින් වූ බැවින්, ඔවුන්ගේ කටයුතු සහ කාර්යයන් අභ්‍යන්තර විගණකගේ විෂය පථය යටතේ පැවති බැවින් පත් කිරීමේ ස්වාධීනත්වය සැකසහිතය. එබැවින් කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීමේදී විනිවිද භාවයෙන් යුතු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. එබැවින් අභ්‍යන්තර විගණකවරයාගේ ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය අඩු විය හැකිය. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමේදී, අභ්‍යන්තර විගණක සඳහා වාර්තා කිරීමේ වාර ගණන සහ වාර්තා කිරීමේ කාල ඉලක්ක නිර්වචනය කර නොතිබුණි. | යොමුකිරීමේ අනුදේශ මගින් විගණන සැලැස්ම / කාර්ය රාමුව ඉල්ලා තිබේ. ටෙක් 8 හි විස්තර දක්වා ඇත. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමේදී කාර්යසාධන නිර්ණායක පැහැදිලිව නිර්වචනය කළ යුතු අතර අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යසාධනය විගණන කමිටුව විසින් ඇගයීමට ලක් කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 ජාතික විගණන පනතේ 40 (3) වගන්තිය සහ මු.රෙ. 134 (1) අනුව, අභ්‍යන්තර විගණකාධිපතිවරයා සෘජුවම ආයතන ප්‍රධානියාට හෝ පාලක මණ්ඩලයට වාර්තා කළ යුතුය. කෙසේ වුවද, අදාළ වන නීති සහ රෙගුලාසිවලට අනුකූලව, වගකීම් වාර්තා කිරීම සඳහා යොමුකිරීමේ අනුදේශවල විධිවිධාන සකස් කර නොතිබුණි. ඉහත විධිවිධානවලට පටහැනිව, 2019 වසර සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 2021 ජූලි 06 වැනි දින අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණි. | 2020 සහ 2021 වර්ෂ සඳහා වන අභ්‍යන්තර විගණන වාර්තාව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යොමු කරන ලෙස අපි අභ්‍යන්තර විගණකවරයාගෙන් ඉල්ලා සිටිමු. | අභ්‍යන්තර විගණන වාර්තා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වෙත හෝ විගණන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 සහ 2021 වර්ෂ සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 2022 ඔක්තෝම්බර් 20 දින වන විටද ලැබී නොතිබුණි. එබැවින්, හඳුනාගත් ගැටළු සඳහා කොමිෂන් සභාවට කාලීන ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි විය හැකිය. තවද, බාහිර විගණකවරයාගේ කාර්ය සැලසුම් කිරීමේදී සහ කාර්ය සිදු කිරීමේදී අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යය උපයෝගී කර ගැනීමට බාහිර විගණකවරයාට නොහැකි විය. | 2020 වසරේ වාර්තාව 2022 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලැබී තිබුණි. එහි පිටපතක් ඉක්මනින් ඔබ වෙත නිකුත් කරනු ඇත. 2021 වර්ෂයේ වාර්තාව මේ දක්වා ලැබී නොමැත. 2019 වසරේ අභ්‍යන්තර විගණන වාර්තාව පිළිබඳව 2021-07-30 දින පැවති විගණන කමිටු රැස්වීමේ දී සාකච්ඡා පවත්වා ඇත. 2021-11-10 දින පැවති රැස්වීමේදී පසු විපරම් ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා පවත්වා ඇත. විගණන කමිටුවේ නිර්දේශ සහිත විගණන කමිටු රැස්වීම් වාර්තාව කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. තවද, එවැනි අභ්‍යන්තර විගණන වාර්තා පිළිබඳව විගණන කමිටුවේදී සාකච්ඡා කළ අවස්ථාවේ දී, මෙම කමිටුව සඳහා සහභාගි වීමට ආරාධනා කරනු ලැබූ බාහිර විගණකවරයා ද එම කමිටුවට සහභාගී වී සිටියේය. | අභ්‍යන්තර විගණන වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂ - මුදල් හා පාලන විගණන කමිටුවේ කැඳවුම්කරු වේ. තවද, 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් නිකුත් කරන ලද රජය සතු ව්‍යාපාර සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුව විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකුට විගණන කමිටුව සඳහා සහභාගී වීමට විධිමත්ව ආරාධනා කර නොතිබුණි. | ආයුගණක උපදේශවරයා සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම සඳහා 2022 වර්ෂය සඳහා එක් විගණන කමිටු රැස්වීමක් පවත්වා තිබුණි. 2020 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වාර්තාව සභාගත කිරීම සඳහා ඉතා ඉක්මනින් විගණන කමිටු රැස්වීමක් පැවැත්වීමට අපි අදහස් කරන්නෙමු. සභාපතිවරයාගේ ඉල්ලා අස්වීම හේතුවෙන් විගණන කමිටුව මේ වසරේ දී නැවත පිහිටුවන ලද බව සටහන් කර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. | විගණන කමිටු රැස්වීම් අදාළ වන මාර්ගෝපදේශ හා මනා පරිචයන්ට අනුකූලව නියමිත වේලාවට පැවැත්විය යුතුය. |